කැලණිය විශ්වවිද්‍යාලය - ශ්‍රී ලංකාව

දුරස්ථ සහ අඛණ්ඩ අධ්‍යාපන කේන්ද්‍රය

ශාස්ත්‍රවේදී (සාමාන්‍ය) උපාධි දෙවන පරීක්ෂණය (බාහිර) - 2015

2021 මාර්තු - 2022 ජනවාරි

සමාජීයවිද්‍යා පීඨය

# පුරාවිද්‍යාව

## අභිලේඛන හා නාණක විද්‍යාව ARCH E 2025

පැරණි විෂය නිර්දේශය සඳහා ප්‍රශ්න පහකට (05) පිළිතුරු සපයන්න.
නව විෂය නිර්දේශය සඳහා ප්‍රශ්න හතරකට (04) පිළිතුරු සපයන්න.

**ප්‍රශ්න සංඛ්‍යාව : අටයි (08)** **කාලය : පැය 03 යි.**

1. ශිලාලේඛන යන්න හඳුන්වා , පුරාවිද්‍යාවේ දී ශිලාලේඛනවල වැදගත්කම පිළිබඳ නිදර්ශන සහිතව පැහැදිලි කරන්න.

2. ශ්‍රී ලංකාවේ ලේඛන කලාවේ ආරම්භය ප්‍රාග් මහින්ද යුගයේ සිදුවිය. මේ කියමනෙහි සත්‍ය අසත්‍යතාව විමසන්න.

3. ක්‍රිස්තු වර්ෂ හතර වන සියවස තෙක් ශ්‍රී ලංකාවේ භාවිත බ්‍රාහ්මී අක්ෂර වර්ධනයෙහිලා බලපෑ විදේශීය ආභාසයන් කවරේදැයි උදාහරණ සහිතව විග්‍රහ කරන්න.

4. මුල් යුගයේ සිට අනුරාධපුර යුගය අවසානය දක්වා, ශිලාලේඛනවල දක්නට ලැබෙන බ්‍රාහ්මී නොවන සංකේත පිළිබඳ පැහැදිලි කරන්න.

5. ශ්‍රී ලංකාවේ හා ඉන්දියාවේ භාවිත මුල්ම කාසිය වූ හස් එබූ කහාපන කාසිය පිළිබඳව විමර්ශනාත්මක විග්‍රහයක් කරන්න.

6. මධ්‍යකාලීන රන් කහවනුව ශ්‍රී ලාංකීය කාසි ඉතිහාසයේ සන්ධිස්ථානයකි. විමසන්න.

7. ඉන්දු ග්‍රීක කාසිය පෙර අපර දෙදිග සංස්කෘතීන්ගේ සම්මිශ්‍රණයක් සහිත ඉන්දියාවේ මුල්ම කාසිය වේ. විස්තර කරන්න.

8. පහත සඳහන් මාතෘකා අතරින් දෙකක් (02) පිළිබඳ කෙටි සටහන් ලියන්න.
    1. කතරගම ක්ෂත්‍රියන් පිළිබඳ හෙළිවන ශිලාලේඛන සාධක
    2. තෝණිගල ලිපිය හෝ කොණ්ඩවටවාන ලිපිය
    3. ලක්ෂ්මී කාසියෙන් නිරූපිත පුරාණ සමාජ තත්ත්වය
    4. සමුද්‍ර ගුප්ත රජුගේ කාසි

************************